**කොළඹ විශ්වවිද්‍යාලය - 2017**

**-----------------------------------------------------------**

කොළඹ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට පටහැනිව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් 2013 වර්ෂයේ දී 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨයේ පීඨාධිපති ඇතුළු කථිකාචාර්යවරුන් 09 දෙනෙකු මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරමින් පවතී.

මෙම සමාගමේ ප්‍රධාන කාර්යාලය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතුව පවතින පරිගණක උපාංග ඇතුලු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර ඇති නමුත් විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබඳ එකඟතා ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතය වෙනුවෙන් රු.246,144 ක මුදලක් පමණක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නඩත්තු අංශයේ 2017 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ ඉන්වොයිස් සැසඳීමේදී ඒවායෙහි දක්වා තිබූ භාණ්ඩ ඒකකයන්හි මිල ගණන් අතර වෙනස්කම් දක්නට ලැබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට නියැදියට භාජනය වූ තොගයේ වටිනාකම රු.9,088,403 කින් වැඩියෙන් ගණනය කර තිබුණි. තවද, එම අංශයේ ගබඩාවේ භෞතිකව පැවති වටිනාකම රු.16,819 ක් වූ තොගයක් අවසන් තොග ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ආ) වෛද්‍ය පීඨයේ සහ විද්‍යා පීඨයේ 2017 දෙසැම්බර් 31 දිනට රු.10,804,891 ක් වූ තොගයක් පැවති අතර එම තොගය අවසන් තොගය ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේදී අවස්ථා 02 කදී ලබාදී තිබුණු 2017 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණු එකතුව රු.223,050 ක අත්තිකාරම් නොපියවූ අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මූල්‍ය ක්‍රියාකරකම් යටතේ දක්වා තිබුණු රාජ්‍ය ප්‍රදාන වටිනාකමට අමතරව සංචිත සහ අරමුදල් යටතේ ගිණුම් අතර මාරු කිරීමක් වූ රු.542,597,096 ක් වටිනා වැය නොකළ

ප්‍රාග්ධන ප්‍රදාන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ලැබීම් ලෙස ගලපා තිබුණි. තවද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදලින් ආයතනයට නොලැබුණු රු.363,760 ක් වටිනා විදේශ විනිමය ලාභ ඇතුළත් කර තිබුණි.

(ii) ඉතිරි කිරීමේ ගිණුමක පැවති රු.146,808 ක ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්විය යුතු වුවත් එය ආයෝජන යටතේ දක්වා තිබුණි.

(iii) අනෙකුත් ලැබිය යුතු දෑ සහ අත්තිකාරම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු පිළිවෙලින් රු.2,139,915 ක් සහ රු.174,478,148 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී කාරක ප්‍රාග්ධන වෙනස යටතේ දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යා පීඨයට අදාළ විවිධ අත්තිකාරම් ලේඛනය අනුව 2017 දෙසැම්බර් 31 දිනට නොපියවූ ශේෂය රු.298,963 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය රු.358,963 ක් වූයෙන් අත්තිකාරම් අගයෙහි රු.60,000 ක වෙනසක් විය.

(ආ) පාඨමාලා ආදායම් එකතු කිරීමේ ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය 2017 දෙසැම්බර් 31 දිනට රු.690,282 ක් වුවත් බැංකු ශේෂ සනාථන ලිපියට අනුව එම ශේෂය රු.7,091,000 ක් වූ බැවින් රු.6,400,718 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් නිලධාරීන් 15 දෙනෙකු වෙත ලබාදී තිබූ රු.3,711,000 ක ණය මුදලින් රු.1,348,995 ක ණය ශේෂ අවුරුදු 02 ත් අවුරුදු 15 ත් අතර කාලයක සිට පැවත එන අතර එම ශේෂයන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ වාර්ෂිකව පැවැත්වෙන ක්‍රීඩා උත්සවයට අදාළ වියදම් පියවා ගැනීම සඳහා Amalgamated Club Loan ලෙස 2015, 2016 හා 2017 වර්ෂයන්හිදී ලබාදී තිබුණු අත්තිකාරම් මුදලින් රු.4,474,645 ක ශේෂයක් විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 14 වන විටත් පියවා නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) XIX වැනි පරිච්ඡේදයේ 5 වන ඡේදය - | නිවාස කුලී අයකිරීමේදී යොමුගත රෙගුලාසියට පටහැනි ලෙස විශ්වවිද්‍යාල පාලක සභාව මඟින් 2015 ජූලි 09 දින පැවැත්වූ 496 වැනි පාලක සභා රැස්වීමේදී පවුල් නිවාස නිලධාරියෙකුගේ මූලික වැටුපෙන් සියයට 10 ක්ද 2016 මාර්තු 09 දින පැවැත්වූ 506 වැනි පාලක සභා රැස්වීමේදී තනි පුද්ගල නිලධාරියෙකුගේ මූලික වැටුපෙන් සියයට 3 ක්ද ලෙස නිවාස කුලී අයකරගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| | | - අංක 7/7/9 දරන වර්ග අඩි 1,050 කින් යුතු විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත 2002 පෙබරවාරි 01 දින සිට පවරා තිබුණු නිල නිවස සඳහා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස 2014 දෙසැම්බර් 31 දින සිට නිවාස කුලී අය නොකිරීමට 2014 සැප්තැම්බර් 10 දින පැවති 487 වන විශ්වවිද්‍යාල පාලක සභා කමිටුව තීරණය කර තිබුණි. |
| (ii) | XIX වැනි පරිච්ඡේදයේ 6 වන ඡේදය | - යම් කිසි තනතුරකට වෙන්කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියලුම නිවාසවල බඳු කාලය වර්ෂ 05 ක් වුවද නිවාස 09 ක නිලධාරීන් වර්ෂ 06 සිට වර්ෂ 16 දක්වා කාලයක් පදිංචිව සිටින බව නිරීක්ෂණය විය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------------------------- | |
| (i) | මුදල් රෙගුලාසි104 (3) හා (4) | විශ්වවිද්‍යාලය සතු රු.4,750,000 ක් වටිනා මෝටර් රථය 2017 ජනවාරි 03 දින අනතුරකට භාජනය වී තිබුණු අතර මෙම අනතුර සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. අනතුර සම්බන්ධව මූලික විමර්ශනයක් පවත්වා තිබුණද ප්‍රාරම්භක වාර්තාවක් හා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - අත්තිකාරම් ලබාදීමේදී ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ට සීමා විය යුතු වුවත් රු.130,618 සිට රු.150,000 ක පරාසයක ශ්‍රීපාලි මණ්ඩපයේ අවස්ථා 03 කදී එකතුව රු.412,619 ක අත්තිකාරම්ද, විශ්වවිද්‍යාලයේ නිලධාරීන් 16 දෙනෙකු වෙත අවස්ථා 14 කදී රු.150,422 සිට රු.369,150 ක් දක්වා පරාසයක එකතුව රු.4,153,393 ක් වටිනා අත්තිකාරම්ද ලබාදී තිබුණද ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණි.<br><br>- ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිම කර වහාම පියවිය යුතු වුවත් ශ්‍රීපාලි මණ්ඩපයේ අවස්ථා 06 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.361,540 ක අත්තිකාරම් 2018 ජනවාරි 10 දින වන විටත් පියවා නොතිබූ අතර නොපියවූ කාල පරාසය දින 13 සිට මාස 12 දක්වා බව නිරීක්ෂණය විය. තවද, විශ්වවිද්‍යාලය විසින් 2012, 2016 හා 2017 යන වර්ෂයන්හිදී අවස්ථා 22 කදී පුද්ගලයින් සහ ආයතන වෙත ලබාදී තිබුණු රු.2,411,812 ක් වටිනා අත්තිකාරම් විගණිත දිනය වූ 2018 අගෝස්තු 17 වන විටත් පියවා නොතිබූ බව නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය තුළ ආචාර්යවරුන් වෙත පර්යේෂණ කටයුතු සඳහා අත්තිකාරම් ලෙස ලබාදී තිබුණු රු.804,260 ක් 2018 සැප්තැම්බර් 14 දින දක්වාම පියවීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. |

(ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන නිලධාරීන් 821 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සනාථ කරගත නොහැකිවීම හේතුවෙන් රු.822,509,565 ක වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය. |
| (ii) | XXII වැනි පරිච්ඡේදයේ 11.1 වගන්තිය | පරීක්ෂණ නිලධාරියා අවසාන තීරණයකට එළඹෙන තුරු හැකිතාක් දුරට නොකඩවා රැස්වී මාස තුනක් ඇතුළත විනය පරීක්ෂණ අවසන් කළ යුතුය. එසේ වුවද 2016 අප්‍රේල් 25 දින වැඩ තහනමට ලක්වූ ආචාර්යවරයෙකු සම්බන්ධ විනය පරීක්ෂණය 2018 මාර්තු මාසය දක්වා අවසන් වී නොතිබූ අතර ඒ සඳහා අවුරුදු 01 ත් මාස 10 ක කාලයක් ගත වී තිබුණි. |
| (iii) | XXVI වැනි පරිච්ඡේදයේ 3 වන වගන්තිය | ශ්‍රීපාලි මණ්ඩපයේ 2015 වර්ෂයේ පැවැත්වූ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව රු.162,311 ක් වටිනා පොත් 713 ක් සහ එ.ජ ඩොලර් 126 ක් වටිනා පොත් 06 ක් අස්ථානගත වී තිබූ අතර මෙම නැති වූ පොත් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී එම විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ශ්‍රීපාලී මණ්ඩපය විසින් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද විභාග 06 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 05 ත් මාස 12 ත් අතර කාලයක් ගතකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.100,339,281 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.176,157,091 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.75,817,810 ක පිරිහීමක් ඇති වී තිබුණි. රජයේ සහ වෙනත් ප්‍රදාන රු.143,645,382 කින් වැඩි වී තිබුණද සේවක පාරිශ්‍රමික රු.274,467,864 කින් වැඩි වීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති රු.214,339,468 ක අතිරික්තය උච්චාවචනයන් සහිතව 2017 වර්ෂය වන විට රු.100,339,281 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.1,788,616,882 ක්වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.3,198,399,374 ක් වී තිබුණි.

## 3.2 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

2000 වසරේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කොළඹ විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් අවසන් නොවූ නඩු කටයුතු 37 ක් පැවති අතර මෙම නඩු කටයුතු වසර 03 සිට වසර 17 ක් දක්වා වූ කාල පරාසයකට අයත්විය. තවද සමාලෝචිත වර්ෂය සඳහා නීති වියදම් ලෙස රු.3,373,674 ක මුදලක් වැය කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

2016 වර්ෂයේ සිට කොළඹ විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ගොඩනැගිල්ලක් තත්‍ය මණ්ඩල සම්බන්ධීකරණ කේන්ද්‍රය (VCUC – CC) සඳහා වෙන්කර තිබූ අතර මේ වෙනුවෙන් 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපනය (HETC) ව්‍යාපෘතිය මඟින් 2013, 2014 හා 2015 වර්ෂයන්හි රු.1,341,239 ක් වටිනා වත්කම් මිලදී ගෙන තිබුණද 2012 වර්ෂයේ අනුමත කළ කාර්ය මණ්ඩලය බඳවා නොගැනීම හේතුවෙන් මිලදීගත් වත්කම් නිෂ්කාර්යව පැවතුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ භික්ෂු නේවාසිකාගාරය 2006 වර්ෂයේ සිට බදු කුලී පදනම මත පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර මාසික කුලිය ලෙස රු.325,000 බැගින් 2017 වර්ෂය සඳහා රු.3,900,000 ක මුදලක් ගෙවා තිබුණි. නේවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතු බදුකරු විසින් සිදුකළ යුතු බවට කොන්දේසි 2017 ජනවාරි 18 දින අත්සන් කරන ලද බදු ගිවිසුමෙහි ඇතුළත්ව තිබුණද නේවාසිකාගාරය වර්ෂ ගණනාවකින් අළුත්වැඩියා කර නොතිබීම හේතුවෙන් නාන කාමර හා වැසිකිළි භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණු අතර බිත්ති දුර්වර්ණ වී තිබුණි. වසර 10 කටත් වැඩි කාලයක සිට කුලී පදනම මත පවත්වාගෙන යන නේවාසිකාගාරය සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.25,555,000 ක මුදලක් කුලී ලෙස ගෙවා තිබුණි. විශ්වවිද්‍යාලයට ස්ථිරවම භික්ෂු නේවාසිකාගාරයක අවශ්‍යතාවය තිබුණද මේ දක්වාම එම කාර්යය ඉටු වී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) වාහන අළුත්වැඩියා ලිපිගොනු පරීක්ෂා කිරීමේදී වාහන අනතුරු ලෙස හඳුනාගත හැකි අළුත්වැඩියාවන් හා සෘජුවම අනතුරු සම්බන්ධ සටහන් ගොනුවල පැවතුණද ඊට අදාළව විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 6 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. අනතුරු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබීමෙන් අනතුරු පිළිබඳව තොරතුරු අනාවරණය නොවන තත්ත්වයක් පවතින බවද අළුත්වැඩියා වියදම් සඳහා රක්ෂණාවරණ ලබාගැනීමට අවස්ථාවද අහිමිවන බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) 2017 ජනවාරි සිට නොවැම්බර් දක්වා සැපයුම්කරුවන් වෙත යවා තිබුණු රු.1,917,285 ක් වටිනා ඇනවුම් 34 කට අදාළ භාණ්ඩ 2017 දෙසැම්බර් 31 දින දක්වා ගබඩාව වෙත සපයා නොතිබුණි. විගණන විමසුමෙන් පසුව එම ඇණවුම් අවලංගු කර ඇති බව විගණනය වෙත දන්වා තිබුණි.

(ඇ) විද්‍යා පීඨය සඳහා ශිෂ්‍යයන් 515 දෙනෙක් බඳවා ගැනීමට හැකියාව තිබුණද 2017 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගෙන තිබුණ ශිෂ්‍ය සංඛ්‍යාව 404 ක් පමණි. ඒ අනුව ශිෂ්‍යයන් 111 කට විශ්ව විද්‍යාල අවස්ථා අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) ශ්‍රීපාලි මණ්ඩපය

(i) මණ්ඩපයේ පිරිමි නේවාසිකාගාරය හා දේශන ශාලා 3 ක් ඉතා පැරණි ඒවා වන අතර දීර්ඝ කාලයක සිට අළුත්වැඩියා කටයුතු සිදු නොවීමෙන් ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු කරගෙන යාමට සුදුසු තත්ත්වයේ නොවූ බව නිරීක්ෂණය විය.

(ii) පරිපාලන ගොඩනැගිල්ල තුළ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිවීමත්, පොදු පහසුකම් අවමවීමත් ගොඩනැගිල්ලේ කොටසක් පුපුරා ගිලා බැසීමේ අවධානමක් පවතින බවත් නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2016 ඔක්තෝබර් 28 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් රු.මිලියන 149.47 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද 2018 ඔක්තෝබර් 08 දින දක්වා ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(iii) මණ්ඩපය සතුව සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා සුදුසු කලාගාරයක් නොපවතින අතර සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ආලෝකකරණය පැවතිය යුතු වුවත් ඔවුන්ට එම පහසුකම් විශ්වවිද්‍යාලය වෙතින් ලබාදී නොතිබුණි.

(iv) දේශන ප්‍රතිමාන සැලැස්ම හා විෂය කාලසටහන් අනුව එක් එක් ආචාර්යවරයා විසින් පැවැත්විය යුතු දේශන පැය ගණන හා තත්‍ය වශයෙන් පැවැත්වූ දේශන පැය ගණන සැසඳීමේදී ඇතැම් ආචාර්යවරුන් විසින් කාල සටහනෙහි ඇති දේශන පැය ගණන සම්පූර්ණ කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(v) අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම හා විභාග පැවැත්වීම දින වකවානු සැලැස්මක් මත සිදුකළ යුතු වුවත් එවැනි අපේක්ෂිත දිනයක් නොමැතිව පාඨමාලා 04 ක් සඳහා විභාග 05 ක් පවත්වා තිබූ බව නිරීක්ෂණය විය.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-----------------------------

මූලා ප්‍රකාශන අනුව වෙන්දේසි කළ හැකි භාණ්ඩවල වටිනාකම රු.2,888,935 ක් ලෙස දැක්වුණු අතර මෙයින් රු.1,455,582 ක් වටිනා භාණ්ඩ 2014 සහ 2016 වර්ෂයන්හි වෙන්දේසි කිරීමට තීරණය කළ ඒවා වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම භාණ්ඩ වෙන්දේසි කර නොතිබුණි.

**4.4 ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම**

------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 32 දෙනෙකු විසින් ගිවිසුම් කඩකිරීම හේතුවෙන් රු.43,349,296 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. මින් ආචාර්යවරුන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු.18,358,698 ක ශේෂය වර්ෂ 21 සිට වර්ෂ 40 දක්වා කාල පරාසයක් ගතවී තිබුණ ද කිසිදු මුදලක් අය කර ගෙන නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව 753 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 190 ක් විය. මෙයින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හා මහාචාර්ය තනතුරු 30 ක් පුරප්පාඩුව පැවති අතර 2017 වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරු 263 දෙනෙකුගේ සේවය ලබාගැනීම වෙනුවෙන් රු.143,602,216 ක් ගෙවා තිබුණි.

(ආ) <u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

(i) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 1,119 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 278 ක පුරප්පාඩු පැවතුණි. අනුමත කළමනාකරණ සහකාර තනතුරු 301 න් තනතුරු 66 ක් පුරප්පාඩුව පැවති අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් එවනු ලබන නාම ලේඛනය මඟින් මෙම පුරප්පාඩු පිරවීමට සිදු වීම නිසා ප්‍රමාදයන් පවතින බව උපකුලපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) තාක්ෂණ නිලධාරී හා තාක්ෂණ නිලධාරී (තොරතුරු සන්නිවේදන) තනතුරු පිළිවෙලින් 05 ක් හා 19 ක් පුරප්පාඩුව පැවති අතර තාක්ෂණ නිලධාරී (තොරතුරු සන්නිවේදන) තනතුරු සඳහා කොමිෂන් සභාවෙන් බඳවා ගැනීමේ පරිපාටියක් නිකුත් කර නොමැති බැවින් එකී පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇති බව උපකුලපතිවරයා විගණනය වෙත දන්වා තිබුණි.

(iii) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක තනතුර සඳහා 2015 සැප්තැම්බර් 9 දින පැවති 499 වන පාලක සභා රැස්වීමේදී ගත් තීරණයක් පරිදි විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ඔහුගේ රාජකාරී කටයුතුවලට අමතරව පත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පරිපාලන අරමුදලින් ඔහු වෙත රු.12,000,000 ක් ගෙවීම් කර තිබුණි.

## 4.6 වාහන උපයෝජනය

-------------------------

2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයක උපකුලපති, ලේඛකාධිකාරී, ප්‍රධාන මූල්‍යාධිකාරී, පුස්තකාලධිපති, පීඨාධිපති යන තනතුරු නිලවාහන හිමි තනතුරු වේ. ඔවුන්ට අනුයුක්ත වාහන සඳහා ඉන්ධන දීමනාව මාසික වැටුපට එකතුකොට ගෙවීම් කළ යුතු නමුත් අදාළ නිලධාරීන් කිසිවෙකුටත් ඉන්ධන දීමනාවක් ලෙස නොගෙවා වෙන්කර ඇති වාහන සඳහා විශ්වවිද්‍යාල ඉන්ධන ඇණවුම් මඟින් ඉන්ධන ලබාදී තිබුණි. ඒ අනුව ඉන්ධන ඇනවුම් මඟින් මාසික ඉන්ධන දීමනාව ඉක්මවා ඉන්ධන ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. නිලධාරීන් 07 දෙනෙක් වෙනුවෙන් 2017 ජනවාරි සිට අගෝස්තු දක්වා ගෙවිය යුතු ඉන්ධන දීමනාව රු. 1,053,540 ක් වුවද ඇණවුම් මඟින් ලබාදී තිබුණු ඉන්ධනවල වටිනාකම රු.2,345,437 ක් විය. ඒ අනුව නියමිත ඉන්ධන දීමනාව ඉක්මවා රු. 1,291,897 ක් වැඩිපුර වැයකර තිබුණු බව නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

---------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

-----------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව කොළඹ විශ්වවිද්‍යාලය විසින් දැනුවත් වී තිබුණු අතර එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම

සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර තිබුණි. 2017 වර්ෂයේදී දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අනුකූලව අයවැයකරණය, ආබාධිත පුද්ගලයන් සවිබල ගැන්වීම, පාරිසරික ධරණීත්වය ඉහල නැංවීම හා ජල හා ශක්ති සංරක්ෂණය යන අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබුණි.

## 6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 6.1 අයවැය ලේඛනමය පාලනය

පුනරාවර්තන වැය විෂයයන් 20 ක අයවැයගත හා තත්‍ය වියදම සැසදීමේදී සියයට 40 සිට සියයට 153 දක්වා විචලනයන් පැවතුණි. ප්‍රාග්ධන ප්‍රදාන යටතේ පර්යේෂණ සවිබල ගැන්වීම, විශ්වවිද්‍යාල ජාත්‍යන්තරකරණය, දැනුම වැඩිදියුණු කිරීම හා ආයතනික සංවර්ධනය, මානව ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන රු.52,902,908 ක් වර්ෂය තුළ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් වැය විෂයයන්වලට මාරු කර තිබුණි. මේ අනුව අයවැය පිළියෙල කර වරින් වර සමාලෝචනයට ලක් කර තාත්වික ලෙස පාලන කාරකයක් වශයෙන් යොදා ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මෙහෙයුම් පාලනය | නේවාසිකාගාර ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු කරගෙන යාමට සුදුසු පරිසරයක් පවතින ආකාරයට නේවාසිකාගාර පවත්වා නොගැනීම හා නඩු කටයුතු කඩිනමින් නිමකිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය පියවර නොගැනීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් නොකිරීම, අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම සටහන් නොකිරීම. |
| (ඈ) | පුස්තකාල පරිපාලනය | අස්ථානගතවීම් සම්බන්ධ ලේඛන විධිමත්ව පවත්වා නොගැනීම. |
| (ඉ) | ගබඩා පාලනය | නිවැරදි තොරතුරු ඇතුළත් ලේඛන පවත්වා නොගැනීම. |
| (ඊ) | වාහන පාලනය | වාහන අනතුරු සම්බන්ධ වාර්තා නොකිරීම. |